1.8 විශේෂාංග රූප සටහන

# ශ්‍රී ලංකාවේ සංචාරක ඉපැයීම්

## සංචාරක ඉපැයීම් සහ සංචාරක පැමිණීම්




මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

## සංචාරකයෙකුගේ සාමාන්‍ය දෛනික වියදම




මූලය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

## සංචාරකයෙකු මෙරට ගත කරන සාමාන්‍ය කාලය




මූලය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

කොවිඩ් වසංගතය සහ දේශීය ආර්ථික අර්බුදයෙන් පසුව, 2024 සහ 2025 වසරවල දී සංචාරක පැමිණීම් සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. 2025 වසරේ සංචාරක පැමිණීම් 2018 වසරේ දී පැවති මට්ටමට ළඟා වුව ද, සංචාරක ඉපැයීම් යථා තත්ත්වයට පත්වීම 2018 වසරේ දී වාර්තා වූ උපරිම සංචාරක ඉපැයීම් මට්ටමට සාපේක්ෂව අඩු විය. සංචාරක පැමිණීම් සහ ඉපැයීම් අතර මෙම වෙනසට බොහෝ දුරට හේතු වී ඇත්තේ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සංචාරකයෙකු මෙරට ගත කරන සාමාන්‍ය කාලය සහ සංචාරකයෙකු විසින් දිනක් සඳහා දරන සාමාන්‍ය වියදමට[1] අදාළ ඇස්තමේන්තුවල අගයයන් 2018 වසරට සාපේක්ෂව 2025 වසරේ දී අඩු කරමින් සංශෝධනය කර තිබීමයි. ඉහළ සංචාරකයන් ප්‍රමාණයක් හැසිරවීමේ ධාරිතා සීමා මධ්‍යයයේ, දිගු කාලීනව සංචාරක ඉපැයීම් ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකාවට ඉහළ ආදායමක් ලබා දෙන සංචාරකයන් ආකර්ෂණය කර ගැනීම අත්‍යවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන්, ඉහළ වියදම් කරන සංචාරකයන් ආකර්ෂණය කර ගන්නා පරිසර සංචාරක ව්‍යාපාරය, සෞඛ්‍ය සංචාරක ව්‍යාපාරය සහ සුවතා අත්දැකීම් වැනි සාම්ප්‍රදායික නොවන අංශවලට විවිධාංගීකරණය කිරීම ඉතා වැදගත් වේ.

1 ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සංචාරකයින් රටින් පිටත් වීමේ දී සිදුකරන සමීක්ෂණයට අනුව, එ.ජ. ඩොලර් 171.74ක් (2025 ජනවාරි-ජූලි) ලෙස ඇස්තමේන්තු කර තිබූ සංචාරකයෙකු විසින් දිනක් සඳහා දරන සාමාන්‍ය වියදම 2025 අගෝස්තු සිට එ.ජ. ඩොලර් 148.26ක් දක්වා අඩුකරමින් සංශෝධනය කර ඇත.